# <u>වන්දිපූරණ ලිපිය</u>

උපසභාපති - මෙහෙයුම්

HNB සෙකියුරිටීස් සමාගම

4 වන මහල, අංක 53, ධර්මපාල මාවත

කොළඹ 03

ශ්‍රී ලංකාව

හිතවත් මහත්වරුනි,

**ඊ-මේල් සහ/හෝ ෆැක්ස් මගින් උපදෙස් දීම් සම්බන්ධවයි**

01. සේවාදායකයන් වශයෙන් (මෙහි උපලේඛනයේ “A” යටතේ නම් කර ඇති) මම/අප හට HNB සෙකියුරිටීස් සමාගම (HNB Securities Limited - “HSL”) සමග ආයෝජන බැංකුකරණ සබඳතාවක් පවතියි. මෙම සබඳතාව පවතින කාලය අතරතුර, මෙහි උපලේඛනයේ “C” යටතේ දක්වා ඇති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මම/අප විසින් කලින් කලට උපදෙස් ලබාදීමට අදහස් කරන අතර, දක්වා ඇති නීතිරීති සහ කොන්දේසි වලට හා පහතින් දක්වා ඇති වන්දිපූරණ වලට යටත්ව HSL විසින් පිළිගනු ලබන ආකාරයකට හා ක්‍රමයකට අනුව වන විද්‍යුත් තැපැල ("ඊ-මේල්") සහ/හෝ ෆැක්සිමිලි ("ෆැක්ස්") මගින් අපගේ උපදෙස් නිකුත් කිරීමේ පහසුකම අප වෙත ලබාදීමට HSL එකඟ වී ඇත.

02. මම/අප විසින් ඊ-මේල් උපදෙස් ("ඊ-මේල් උපදෙස්") මෙහි උපලේඛනයේ “D” යටතේ දක්වා ඇති ("ආරම්භක ඊ-මේල් ලිපිනය") ආරම්භක ඊ-මේල් ලිපිනය/ලිපින වෙතින් එය ලැබිය යුතු ඊ-මේල් ලිපිනය - client@hnbsecurities.lk වෙත ("ලැබිය යුතු ඊ-මේල් ලිපිනය") සම්ප්‍රේෂණය කරනු ඇත. ෆැක්ස් උපදෙස් ලබාදෙන විටෙක දී, ‘E’ යටතේ දී ඇති ෆැක්සිමිලි සම්ප්‍රේෂණ අංකය වෙත හෝ HSL විසින් ලබාදෙන ලද වෙනත් යම් විකල්ප ෆැක්ස් අංකයක් වෙත එකී සියලුම ෆැක්ස් උපදෙස් යවනු ඇත. එවැනි ෆැක්ස් උපදෙස් වල සහ ආරම්භක ඊ-මේල් ලිපිනය වෙතින් ආරම්භ කර, "ලැබිය යුතු ඊ-මේල් ලිපිනය" වෙත යවනු ලබන ඊ-මේල් උපදෙස් වල සත්‍යතාව සහතික කිරීම පිණිස වන සියලු පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගැනීමට මම/අප එකඟ වෙමි/වෙමු. මම/අප වෙත HSL විසින් ලබා දී ඇති පහසුකම අනවසර භාවිතයකට පත් වීම වැළැක්වීම පිණිස නිසි ආරක්ෂාව සහ ප්‍රවේශ පාලන ක්‍රමවේද නිසි පරිදි ක්‍රියාත්මකව පවතින බව සහතික කිරීමට අවශ්‍ය සියලු පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගැනීමට ද මම/අප එකඟ වෙමි/වෙමු.

03. මෙමගින් මම/අපිඃ

a) මම/අප විසින් ලබා දෙන ලද එවැනි ඊ-මේල්/ෆැක්ස් උපදෙස් අනුව ක්‍රියා කිරීමේ හෝ ක්‍රියා නොකිරීමේ (ඒ සම්බන්ධයෙන් හේතු කිසිවක් ලබාදීමට බැඳීමක් නොමැතිව) පරම අභිමතය HSL සතු බවට තහවුරු කරමි / කරමු. එවැනි උපදෙසක්/උපදෙස් අනුව ක්‍රියා නොකිරීමට තෝරාගන්නා අවස්ථාවක, ප්‍රායෝගිකව හැකි ඉක්මනින් මම/අප වෙත ඊ-මේල්/ දුරකථන/ ෆැක්ස් මගින් ඒ බව දැන්වීම සඳහා HSL උත්සාහ දරනු ඇති බවට අප අවබෝධ කරගෙන සිටිමු. HSL විසින් පිළිගනු ලැබූ ඊ-මේල්/ෆැක්ස් උපදෙසක් මත ක්‍රියා කිරීම සම්බන්ධයෙන් හෝ HSL විසින් පිළිගනු නොලැබූ ඊ-මේල්/ෆැක්ස් උපදෙසක් මත ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් හෝ HSL වෙත කිසිදු වගකීමක් නොපැවරෙන බව මම/අප තහවුරු කර, පිළිගනිමි / පිළිගනිමු;

b) ඊ-මේල් / ෆැක්ස් උපදෙස් වල අඩංගු කළ දෑ සම්බන්ධයෙන් මම/අප බැඳී සිටින බව සහ, HSL විසින් එවැනි ඊ-මේල්/ෆැක්ස් උපදෙස් පිළිගත් අවස්ථාවක දී, වැඩ කරන සම්පූර්ණ දින එකක දී {අදාළ අවස්ථාව වනවිට ක්‍රියාත්මක වන අවසන් කිරීමට නියමිත වේලාවන්ට (cut-off times) යටත් ව}, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට HSL බැඳී සිටින බව මම / අපි තහවුරු කරමි/ කරමු. ඊ-මේල් උපදෙස්, "ලැබිය යුතු ඊ-මේල් ලිපිනය" හි 'එන ලිපි' (ඉන්බොක්ස්) වෙතට ඇතුළු වූ අවස්ථාවේ දී එකී ඊ-මේල් උපදෙස් HSL විසින් ලද බවට සහ ෆැක්ස් උපදෙස් සම්බන්ධයෙන් වනවිට එකී ෆැක්ස් උපදෙස් HSL විසින් ලැබුණු විට, ඒවා ලද බවට සැලකෙනු ඇති බවට මම / අප සහ HSL අතර එකඟතාවක් ඇත;

සැක දුරු කිරීමෙහි ලා, මෙකී උපදෙස් සහ වන්දිපූරණ ලිපියෙහි යොදනු ලබන "වැඩ කරන දින" යන යෙදුමෙන් අදහස් වන්නේ, ශ්‍රී ලංකාවෙහි රජයේ/බැංකු/වෙළඳ නිවාඩු දිනයක් නොවන (සෙනසුරාදා හෝ ඉරිදා හැර) දිනයකි;

c) මුල් පිටපතක් වූ ලිපියක්, ෆැක්ස් සහ ඊ-මේල් වශයෙන් HSL විසින් උපදෙස් ලද අවස්ථාවක දී, පළමුවෙන් ලද උපදෙස් බලපැවැත්වෙන බවට මම / අපි තහවුරු කරමි / කරමු;

d) මම / අප විසින් (a) ඊ-මේල්/ෆැක්ස් සම්ප්‍රේෂණය හෝ එහි යම් කොටසක්, කියැවීමට පැහැදිලි නැති, පැටලිලි සහගත, දෝෂ සහගත, එකිනෙකට-පටහැනි, අසම්පූර්ණ හෝ අපැහැදිලි වූ විටෙක හෝ (b) HSL ව්‍යාපාරික වේලාව අවසන් වීමෙන් පසුව හෝ වැඩ කරන දිනයක් නොවන දිනයක ඊ-මේල්/ෆැක්ස් උපදෙසක් ලැබුණු විටෙක හෝ (c) අනපේක්ෂිත විපත් තත්ත්වයක් හෝ යම් සන්නිවේදන පද්ධතියක ඇනහිටීමක්, වර්ජන, කැරලි කෝලාහල, වර්ෂාව, ජලගැලීම්, චණ්ඩ මාරුත, යුද්ධ, සතුරු ක්‍රියා, වසංගත, ඇඳිරිනීති සහ ඒ හා සමාන

තත්ත්වයන් ද ඇතුළුව, නමුත් ඊට සීමා නොවී, HSL හි පාලනයෙන් බැහැර තත්ත්වයක් පැවතීම නිසා හෝ ඇතිවන කුමන හෝ අවස්ථාවක දී ඕනෑම හේතුවක් මත, කිසිදු සීමාවකින් තොරව, ඕනෑම ඊ-මේල්/ෆැක්ස් සම්ප්‍රේෂණයක් මත පදනම්ව HSL විසින් ක්‍රියා කිරීම හෝ ක්‍රියා කිරීමට නොහැකි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඕනෑම හේතුවක් මත මම / අප හට දරන්නට සිදු වන ඕනෑම පාඩුවක්, පිරිවැයක්, හානියක්, හිමිකම් පෑමක් සහ වියදමක් සම්බන්ධයෙන් වූ විටෙක, මම/අප විසින් HSL, එහි නිලධාරීන් සහ නියෝජිතයන් වගකීමට හෝ වගවීමට ලක් නොකරන බවට තහවුරු කරමි /කරමු;

e) මෙහි දැක්වෙන අපගේ ප්‍රතිඥාවන් සහ වන්දිපූරණයන් වලංගු, අවලංගු කළ නොහැකි සහ කිසිදු කොන්දේසියකට යටත් නොවන ඒවා බවත්, එමගින් මාගේ/අපගේ උරුමකරුවන්, පොල්මඃකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන්, අනුප්‍රාප්තිකයන් සහ ලැබුම්කරුවන් බන්ධනීය වන බවට ද, මෙම උපදෙස් සහ වන්දිපූරණ ලිපිය වලංගු ලෙස ක්‍රියාවේ යෙදවීමට, ක්‍රියාවට නැංවීමට සහ ඉෂ්ට කිරීමට අවසර ලබාදීමට මා/ අප විසින් අවශ්‍ය සියලු පියවර ගෙන ඇති බවට ද තහවුරු කරමි/කරමු.

f) මම / අප විසින් ඊ-මේල්/ෆැක්ස් උපදෙස් යැවීමේ පහසුකම භාවිත කරන තාක් කල්, සහ පහසුකම අවසන් කිරීමෙන් පසුව වුවද, ඕනෑම ඊ-මේල්/ෆැක්ස් උපදෙසක් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් ඕනෑම ආකාරයක සහ කිනම් ආකාරයක වුව කවුරුන් විසින් හෝ HSL වෙත සිදුකරන ඕනෑම හිමිකම් පෑමක් සම්බන්ධයෙන් මෙම උපදෙස් හා වන්දිපූරණ ලිපිය වලංගු වන බවට මම / අපි එකඟ වෙමි / වෙමු;

g) මාගේ / අපගේ නමින් පවතින "ආරම්භක ඊ-මේල් ලිපිනය" වෙතින් HSL හි "ලැබිය යුතු ඊ-මේල් ලිපිනය" වෙත යවන ලද ඊ-මේල් උපදෙස්, සහ එවැනි උපදෙස් පිළිබඳ HSL හි වාර්තා, මම / අප වෙතින් HSL වෙත දෙන ලද උපදෙස් පිළිබඳ අවසානාත්මක සාක්ෂි වනු ඇති අතර, ෆැක්ස් සම්ප්‍රේෂණයක් වූ අවස්ථාවක, මාගේ/අපගේ අත්සන/අත්සන් සහිතව එවැනි ෆැක්ස් උපදෙස් ලැබීම පිළිබඳව වන HSL හි වාර්තා එකී උපදෙස් මම/අප වෙතින් ආරම්භක වූ ඒවා බවට අවසානාත්මක සාක්ෂි වනු ඇති බව මම / අප තහවුරු කරමි / කරමු;

h) ෆැක්ස්/ඊ-මේල් උපදෙස් වල වලංගුභාවය, අව්‍යාජභාවය හෝ වෙනත් යමක් නිශ්චය කරගැනීමේ අවශ්‍යතාවක් HSL හට නොමැති බවට මම / අප තහවුරු කරමි / කරමු. මාගේ / අපගේ නම/නම් සහ/හෝ අත්සන/අත්සන් වලින් යුතුව HSL වෙත ලැබුණු ෆැක්ස්/ඊමේල් උපදෙස්, ෆැක්ස් මගින් හෝ ආරම්භක ඊ-මේල් ලිපිනය මගින් හෝ යවන ලද නිසි අවසරය සහිත හෝ රහිත උපදෙස් වුවද, එකී උපදෙස් වලින් බැඳී සිටීමට මම/අප එකඟ වෙමි / වෙමු;

i) මම / අප නමට ලියන ලද සහ අදාළ වේලාවෙහි HSL වාර්තා වල පවතින මාගේ / අපගේ ලිපිනය / ලිපින වෙත සහ/හෝ ෆැක්සිමිලි සම්ප්‍රේෂණ අංකය වෙත යොමු කරනු ලබන වැඩ කරන දින 14ක ලිඛිත දැනුම්දීමකින් යුතුව, උපදෙස් පිළිගැනීමේ පහසුකම අවසන් කිරීම HSL විසින් සිදු කළ හැකි බවට මම / අප තහවුරු කරමි / කරමු. මම / අප සහ/හෝ මාගේ / අපගේ බලයලත් අත්සන්කරුවන් සමග මේ යටතේ සිදු කරන ඕනෑම සන්නිවේදන කාර්යයක් සම්බන්ධයෙන් HSL විසින් එකී ලිපිනය සහ/හෝ ෆැක්සිමිලි සම්ප්‍රේෂණ අංකය යොදා ගනු ලැබිය හැකිය;

j) HSL වෙත වැඩ කරන දින 14ක ලිඛිත දැනුම්දීමකින් යුතුව, සහ පහත උපලේඛනයේ "E" යටතේ දක්වා ඇති ලිපිනය වෙත එකී මුල් දැනුම්දීම භාරදීම/තැපැල් කිරීම මගින්, මෙම පහසුකම භාවිත කිරීම මම/අප විසින් අවසන් කළ හැකිය.

HSL විසින් මම/අප වෙත ඊ-මේල්/ෆැක්ස් උපදෙස් නිකුත් කිරීමේ පහසුකම ලබාදීම සැලකිල්ලට ගනිමින්, HSL විසින් ඕනෑම ෆැක්ස්/ඊ-මේල් උපදෙසකට අනුකූලව කටයුතු කිරීමේ හේතුව (මෙම පහසුකම අනවසරයෙන් භාවිත කිරීම සම්බන්ධයෙන් පැන නගින කරුණු ඇතුළත්ව, ඊට සීමා නොවී) මත ඕනෑම ෆැක්ස්/ඊ-මේල් උපදෙසක් සහ/හෝ ගනුදෙනුවක් සම්බන්ධයෙන්, ෆැක්ස්/ඊ-මේල් සහ/හෝ මෙම ලේඛනය අනුව සහ/හෝ කලින් කලට බලපැවැත්වෙන HSL හි ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි අනුව ක්‍රියා කිරීම මත පැන නගින සියලුම මූල්‍යමය සහ වෙනත් පීඩා, පිරිවැය, පාඩු, වගකීම්, හානි, චෝදනා, ක්‍රියාමාර්ග, නීත්‍යානුකූල ක්‍රියාමාර්ග, හිමිකම් පෑම්, වියදම් සහ නීතිඥ සහ සේවාදායක අතර වන ඍජු හෝ වක්‍ර පිරිවැය ඇතුළත් නමුත් ඊට සීමා නොවී, සියලු ප්‍රතිවිපාකයන්ට එරෙහිව HSL සහ එහි නිලධාරීන් සහ එහි නියෝජිතයන් සෑම අවස්ථාවක දී ම නිදහස්ව හා හානියකින් තොරව හා වන්දිපූරණයකොට තැබීමට හා වන්දිපූරණයට කොන්දෙසි විරහිතව සහ අවලංගු කළ නොහැකි අයුරින් මම / අප එකඟ වෙමි / වෙමු.

මෙම උපදෙස් සහ වන්දිපූරණ ලිපිය ශ්‍රී ලංකාවේ නීති මගින් පාලනය වන අතර, ශ්‍රී ලංකාවේ අනන්‍ය අධිකරණ බලයට විෂය වේ.

ඉහත කී උපලේඛනය;

*(කරුණාකර පැහැදිලි අකුරින් ලියන්න)*

**A. සේවාදායකගේ සම්පූර්ණ නම (නම්) : ……………………………..…………………..**

**………………………………………………………………………………………..**

**ලිපිනය: ………..………………………………………………………………..**

**………………………………………………………………………………………..**

**සේවාදායක කේතය: ………………..………………………………………………**

**පාරිභෝගික ගිණුම් අංකය. ……………………………………..……………..........**

**B. උපදෙස් ලබාදීමට කැමති ආකාරය**

□ ෆැක්ස් □ ඊ-මේල් □ දෙයාකාරයෙන්ම

**C. මෙකී උපදෙස් හා වන්දිපූරණ ලිපිය යටතේ ආවරණය වන ක්‍රියාකාරකම්:**

- භාණ්ඩාගාර බිල්පත් / භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන, නැවත ආයෝජනය
- භාණ්ඩාගාර බැඳුම්කර කූපන වලින් ලත් මුදල් ආයෝජනය
- කල්පිරීමට පෙර, ප්‍රතිමිලදී ගැනීම් (Repos)/භාණ්ඩාගාර බිල්පත්/භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන ආපසු ලබාගැනීම්
- ප්‍රතිමිලදී ගැනීම් (Repos)/භාණ්ඩාගාර බිල්පත්/භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන/කල්පිරීමේදී ලැබෙන භාණ්ඩාගාර බැඳුම්කර කූපන වලින් ලත් මුදල්, නියමිත කාලයට පෙර ආපසු ලබාගැනීම්
- ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්, භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර අතර මුදල් පැවරුම්
- සම්බන්ධ විය හැකි දුරකථන අංක වල වෙනස්කම්
- අයදුම්පත මගින් හෝ ඉන් අනතුරුව සිදු කරන ලද යම් සන්නිවේදනයක් මගින් හෝ නිත්‍ය නියෝග වල වෙනස්කම්
- භාණ්ඩාගාර බිල්පත්/භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි වල දී ලංසු තැබීම්

**D. ගනුදෙනුකරු (ආරම්භක ඊ-මේල් ලිපිනය) ඊ-මේල්: 1. ……………………………………**

**(කරුණාකර පැහැදිලිව ලියන්න) 2. ……………………………………**

**E. HSL හි ලිපිනය:** HNB සෙකියුරිටීස් ලිමිටඩ්
4 වන මහල, අංක 53, ධර්මපාල මාවත
කොළඹ 03
ශ්‍රී ලංකාව

අවධානය පිණිස ලකුණු කරන්න: උපසභාපති - මෙහෙයුම්
ෆැක්සිමිලි සම්ප්‍රේෂණ අංකය: 94 11 2 206290

අත්සන් කළේ:

නම ……………………………………… අත්සන ………………………………………
නම ……………………………………… අත්සන ………………………………………
නම ……………………………………… අත්සන ………………………………………

සාක්ෂි ……………………………………… **(නම)** ………………………………………
සාක්ෂි ……………………………………… **(නම)** ………………………………………

**දිනය:** ………………………………………

---